# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1655/13 – 2010 මැයි 26 වැනි බදාදා – 2010.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/19/06/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

එක්සත් ජනතා සේවක සංගමය, අක 09, මාවුස්සා කඩවීදිය, මඩොල්කැලේ.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

1. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 28, මුදලිගේ මාවත, කොළඹ 01. 2. වතු අධිකාරි, ගෝමර රාජ්‍ය වතුයාය, තවලන්තැන්න, (වත්තේගම හරහා),

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

1A – G 12887 – 350 (2010/05)

කොළඹ 08, මාතා පාර, මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමය, අංක බී 9 හි, එන්. ඒ. ජයවික්‍රම මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය.

2010 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/19/06/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

එක්සත් ජනතා සේවක සංගමය, අංක 09, මාවුස්සා කඩවීදිය, මඩොල්කැලේ.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

1. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 28, මුදලිගේ මාවත, කොළඹ 01. 2. වතු අධිකාරි, ගෝමර රාජ්‍ය වතුයාය, තවලන්තැන්න, (වත්තේගම හරහා),

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

තවලන්තැන්න, ගෝමර රාජ්‍ය වතුයායේ පාලක පක්ෂය විසින් එහි තේ කර්මාන්තශාලාවේ කලින් සේවයේ යොදවා සිටි ඒ. ජී. සුනිල්සිරි ජයවික්‍රම මහතා එම වත්තේ ක්ෂේත්‍ර මුරකරුවෙකු වශයෙන් මාරු කර, ඉන් පසුව 2007 මැයි මාසයේ සිට රැකියාව ලබා නොදීම හේතුවෙන්, ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව ද වේ.

**ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර,**
කම්කරු කොමසාරිස්.

2010 අප්‍රේල් මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 211

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.